# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2023 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

---

මෙම ප්‍රශ්න පත්‍රය අදියර I - ව්‍යාපාර පරිසරය විෂය නිර්දේශයෙහි බොහෝ කොටස් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මූලික වශයෙන් මෙහිදී විභාග අයදුම්කරුවන්ගේ විෂයානුබද්ධ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර ඇත. සමස්තයක් ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා සමත්ව තිබූ අතර අනිත් අය පිළිතුරු සැපයීම අතින් අසාර්ථක වී තිබුණි.

අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබූ කාරණාව වන්නේ ප්‍රශ්න හරිහැටි තේරුම් නොගෙන පිළිතුරු සපයා තිබිම ලකුණු ලබා ගැනීමට බාධාවක් වී තිබූ බවයි. නමුත් බහුතරයක් අයදුම්කරුවන් සියලු ප්‍රශ්න වලට සැලකිය යුතු ලකුණු ලබා ගැනීමට සමත් වී තිබුණි.

**පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:**

## <u>A - කොටස</u>

### ප්‍රශ්න අංක 01

මෙම කොටස මගින්, ව්‍යාපාර පරිසරය විෂයයේ සමස්ත ක්ෂේත්‍ර ආවරණය කර ඇති අතර සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර තිබුණි. ලකුණු 100 න් 40 ක් වෙන් කර ඇති අතර අයදුම්කරුවන් බහුතරයක් ලකුණු 20-30 අතර ලබාගෙන තිබුණි. බොහෝ අයදුම්කරුවන් **1.6, 1.8, 1.14** සහ **1.18** යන ප්‍රශ්නවලට සාර්ථක ලෙස පිළිතුරු සපයා නොතිබුණි. ප්‍රශ්න සම්බන්ධයෙන් කළ නිරීක්ෂණ පහත පරිදි වේ.

**1.6** අයදුම්කරුවන්ගෙන් බහුතරයකට කොළඹ කොටස් හුවමාරුව සම්බන්ධයෙන් නිසි ලෙස අවබෝධයක් නොතිබූ බව පෙනුණි. බොහෝ අයදුම්කරුවන් *"එය ආයෝජකයින්ගේ කොටස්, මුදල් බවට පරිවර්තනය කිරීමට උපකාරී වේ"* යන ප්‍රකාශය පිළිතුර ලෙස තෝරා ගෙන තිබුණි. එහෙත් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන ආයතනික සහ තනි ආයෝජකයින් සඳහා කොළඹ කොටස් හුවමාරුව මගින් නියාමනය කරන ලද පරිසරයක් පවත්වාගෙන බව ඔවුන් දැන සිටියේ නැත.

**1.8** බොහෝ අයදුම්කරුවන් තොග වෙළඳාමට අදාල ලක්ෂණයක් හඳුනාගෙන නොතිබුණි. සැලකිය යුතු මට්ටමේ අයදුම්කරුවන් පිරිසක් *"සැලකිය යුතු ණය ගනුදෙනු ප්‍රමාණයක් ඇතුලත් වීම"* යන නිවැරදි පිළිතුර වෙනුවට ඔවුන් පිළිතුරු අංක 3 තෝරාගෙන තිබුණි.

**1.14** බොහෝ අයදුම්කරුවන් හිස් පිටසන පිළිබඳව දැන සිටියේ නැත. එබැවින් ඔවුන් ලකුණු ලබා ගැනීමට අසමත් විය.

**1.18** බොහෝ අයදුම්කරුවන් පෝටර්ගේ පංච බලවේග විශ්ලේෂණය හඳුනාගෙන නොතිබුණි. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් ප්‍රශ්නයට පිළිතුරු දීමට අපොහොසත් වී ඇත.

කෙසේවෙතත්, ඉහත ප්‍රශ්න හැර, බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට හොඳින් පිළිතුරු දී ඇත.

## B - කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය "සංස්ථාපිත සමාගම්" යන විෂය මත පදනම් වී ඇත.

**(a) කොටස** සංස්ථාපන සහතිකයේ ඇතුලත් තොරතුරු හඳුනා ගැනීමට අවශ්‍ය විය. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටසට නිසි පිළිතුරු ලබාදී නොතිබූ අතර ඔවුන් නිවැරදි පිළිතුර වෙනුවට කොටස් හිමියන්ගේ විස්තර සහ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ලියා තිබුණි. අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(b) කොටස** රටක ආර්ථිකයට සීමාසහිත පොදු සමාගමකින් ඇති වාසි මෙමගින් පරීක්ෂා කරන ලද අතර බහුතරයක් මෙම ප්‍රශ්නයට ඔවුන්ගේ සාමාන්‍ය දැනුමෙන් පිළිතුරු ලබා දී තිබුණි.

**(c) කොටස** සමාගම් පනතට අනුව සමාගමක නම භාවිත කළ යුතු ආකාරය කෙසේද යන්න පිළිබඳව බොහෝ අයදුම්කරුවන්ට අදහසක් නොතිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට විකල්ප පිළිතුරු ලබාදී ලකුණු 3න් 1ක් පමනක් ලබාගෙන තිබුණි.

### ප්‍රශ්න අංක 03

ව්‍යාපාර උපකාරක සේවා (Support Services) පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු විය.

**(a) කොටස** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් හොඳින් පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි. සමහරක් අයදුම්කරුවන් *"රක්ෂණ ඔප්පු වර්ග"* වෙනුවට රක්ෂණ සංකල්ප ලියා තිබුණි. එබැවින් අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොත් ඇසුරු කර වඩාත් පුළුල් දැනුමක් ලබා ගත යුතුය.

**(b) කොටස** මෙම ප්‍රශ්නයෙන් ව්‍යාපාර සංවිධානයකට රක්ෂණයේ වැදගත්කම පිළිබඳව හේතු පැහැදිලි කිරීම අපේක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් හේතු දෙකක් සඳහා එකම අර්ථය පැහැදිලි කර ඇත. ඒ නිසා ලකුණු 4 න් 2 ක් ලබා ගැනීමට ඔවුන්ට හැකි විය.

**(c) කොටස** බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා ලකුණු 4 න් 3 ක් ලබා ගෙන ඇති අතර ඔවුන්ගේ සාමාන්‍ය දැනුමෙන් සඵලදායී ප්‍රවාහන පද්ධතියක් නොමැති වීම හේතුවෙන් ආයතනයකට මුහුණ දීමට සිදු වන දුෂ්කරතා ඔවුන් සඳහන් කර තිබුණි.

## ප්‍රශ්න අංක 04

මෙය නූතන වෙළඳාම මත පදනම් වූ සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයකි.

**(a) කොටස** E-Way ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට (B2C) ඉලෙක්ට්‍රොනික වෙළඳාමේ යෙදී සිටින බව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන නොතිබුණි. ඒ නිසා ඔවුන් ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී ඇත.

**(b) කොටස** බොහෝ **අයදුම්කරුවන්** විද්‍යුත් වෙළඳාමෙන් ලැබෙන වාසි සහ අවාසි අවබෝධ කරගෙන සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි..

**(c) කොටස** ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා පහසුකම් සපයන රාජ්‍ය ආයතන හඳුනා ගැනීමට අසමත් වීම හේතුවෙන් බොහෝ අයදුම්කරුවන් මෙම කොටස සඳහා ලකුණු 4 න් 2 ක් ලබා ගෙන තිබුණි. බහුතරයක් තමන්ගේ සාමාන්‍ය දැනුමෙන් නිවැරදි උත්තර වෙනුවට සාමාන්‍ය උත්තර ලියා තිබුණි.

උදා: ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව, ආදිය.

සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම කොටසට හොඳින් පිළිතුරු දී තිබුණි.

## ප්‍රශ්න අංක 05

ව්‍යාපාර සඳහා වූ උපකාරක (Support services) සහ ව්‍යවසායකයින් පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීමට බලාපොරොත්තු විය.

**(a) කොටස** බොහෝ අයදුම්කරුවන් හොඳ ජල මාර්ග ප්‍රවාහන පද්ධතියක වාසි හඳුනාගෙන සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි..

**(b) කොටස** බහුතරයක් අයදුම්කරුවන් මෙම කොටසට සාර්ථකව පිළිතුරු ලබා දී නොමැති අතර අපනයනකරුවන් සඳහා වන සේවාවන් වෙනුවට බලපත්‍රලාභී වාණිජ බැංකු වලින් සාමාන්‍ය ජනතාව සඳහා සපයන සේවාවන් පැහැදිලි කර ඇත. එබැවින්, අයදුම්කරුවන් ලකුණු 3 න් 2 ක් ලබා ගැනීමට හැකි විය.

**(c) කොටස** බොහෝ අයදුම්කරුවන් ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර අතර පවතින සම්බන්ධය තේරුම් ගෙන නොතිබුණි. නමුත් ඔවුන් ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර පිළිබඳව වෙන් වෙන් ව විස්තර කර තිබුණි. ඒ නිසා ඔවුන් ලකුණු 4 න් 2 ක් ලබාගෙන තිබුණි.

<u>C - කොටස</u>

**ප්‍රශ්න අංක 06**

මෙය සිසිල් බීම නිෂ්පාදකයෙකු වන C Soft සම්බන්ධයෙන් සිද්ධි අධ්‍යයනය පදනම් කරගත් ප්‍රශ්නයකි. සියලුම අයදුම්කරුවන් පාහේ මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ලකුණු 20 න් 11 ත් 16 ත් අතර ලබාගෙන ඇත.

**(a) කොටස** බොහෝ අයදුම්කරුවන් පිරිසක් C-Soft ව්‍යාපාරික කටයුතු ආචාරධර්මවලට අනුකූලව පවත්වාගෙන යාම සඳහා සලකා බැලිය යුතු සාධක ලියා තිබූ බැවින් ඔවුන්ට ලකුණු 3න් 2ක් ලබා ගැනීමට හැකි විය. එබැවින් බහුතරයකට ව්‍යාපාර ආචාර ධර්ම පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව නිරීක්ෂණය විය. එබැවින්, අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කර ඊට අදාළව හොඳ දැනුමක් ලබා ගත යුතුය.

**(b) කොටස** ප්‍රශ්නය මගින් ව්‍යාපාර කටයුතු සඳහා නව තාක්ෂණ භාවිත කිරීමේ ඇති වාසි පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කරන ලදී. මෙය ස්ව-අධ්‍යයන පොත් වලින් පරිබාහිර ප්‍රශ්නයක් වූ බැවින් ඔවුන් සාමාන්‍ය දැනුමෙන් පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(c) කොටස** ප්‍රශ්නය මගින් පරිසර දූෂණය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් ස්වල්ප දෙනෙක් පරිසර දූෂණය වැළැක්වීම සඳහා අප ජලය පිරිපහදු කිරීම් කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(d) කොටස** මෙම කොටස C-Soft සතුව ඇති ආර්ථික සම්පත් පරීක්ෂා කරන ලදී. බහුතරයක් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. ඔවුන්ගෙන් ස්වල්ප දෙනෙක් පරිගණක මෘදුකාංග, ගොවීන්, ප්‍රවාහන පද්ධතිය සහ පලතුරු ආර්ථික සම්පත් ලෙස ලියා තිබුණි.

**(e) කොටස** **C Soft** ආයතනය ඉතා වැදගත් ඇල්මැතිපාර්ශවයක් වන්නේ ඇයිදැයි යන්න පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. සාමාන්‍ය අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර නොතිබුණි. පරිසර දූෂණය වැළැක්වීම සඳහා **C Soft** හි වැදගත් ඇල්මැතිපාර්ශවයක් ලෙස සමාජය සලකන්නේ මන්දැයි සාමාන්‍ය සංඛ්‍යා අයදුම්කරුවන් පැහැදිලිව පිළිතුරු දී ඇත.

පිළිතුරු දීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා තේරුම් ගැනීම අත්‍යාවශ්‍ය වේ.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

**(1)** ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

**(2)** AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

**(3)** අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

**(4)** විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

**(5)** පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැළකිලිමත් විය යුතුය.

**(6)** උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

**(7)** ''කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව'' ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

**(8)** දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

**(9)** ඒඒටී ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

**(10)** කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

**(11)** හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීය යුතුය.

-***-